# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2047/20 – 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා – 2017.11.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/10/90/2013

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.05.13 දිනැති හා අංක 1862/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.04.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, රුක්මලේ, බාලිකා නිවාස පාර, නො. 213/39 හි පදිංචි බී. ජී. ප්‍රියානි මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහල හි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.07.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,<br>
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 02 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.


1A – G 26703– 21 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කෙටුම්පත
යොමු අංකයː IR/10/90/2013
බී. ජී. ප්‍රියානි මිය,
නො. 213/39,
බාලිකා නිවාස පාර,
රුක්මලේ,
පන්නිපිටිය.

නඩු අංකයː A - 3555

- ඉල්ලුම්කාරිය *(පළමුවන පාර්ශවය)* සහ
සේවා නියුක්තියන්ගේ භාර අරමුදල්
මණ්ඩලය,
පළවෙනි මහළ,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

- වග උත්තරකරු *(දෙවන පාර්ශවය)*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා ඇමති ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2014.04.11 දිනැති නියෝගයෙන් මා පත් කර ඇත.

02. " ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ

සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ IV වන ශ්‍රේණියේ සහකාර නිළධාරී ලෙස සේවය කරන බී.ජී. ප්‍රියානි මහත්මියට ආයතනයේ අභ්‍යන්තර උසස්වීම් ලබා දීමේදී III වන ශ්‍රේණියේ නිලධාරී තනතුරු ලබා නොදීමෙන් යම් අසාධාරණයක් සිදුවූයේද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වූයේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

03. ඉල්ලුම්කාරිය ( බී.ජී. ප්‍රියානි මහත්මිය) සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලද 21(1) නියෝග යටතේ 6-7 ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බේරුම්කරණය ඉදිරියේ පැවැත්වීමට නියම කරන ලද පර්යේෂණයේ කවර පාර්ශවයන් මූලික සාක්ෂි මෙහෙයවිය යුතුද යන්න ගැන දෙපාර්ශ්වයටම ඇහුම්කන් දීමෙන් පසු චොලන්කා නඩුවේ CA - 1196/98 බේරුම්කරණ අංක A- 2636 දරන අභියාචනා තීන්දුව අනුව මෙවන් අවස්ථාවකදී බේරුම්කරුට දෙපාර්ශවයෙන් එක් පාර්ශවයකට ප්‍රථමයෙන් නඩුව ආරම්භ කිරීමට බේරුම්කරුට අයිතියක් ඇති බව පිළිගනිමින් වග උත්තරකාර පාර්ශවයට ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීමට මවිසින් නියම කරන ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන්, එම ආයතනයේ මානව සම්පත් කළමණාකාරිණී සමන්මලී රූපසිංහ මහත්මියගේ සාක්ෂි අනුව උසස් වීම සඳහා අයදුම්පත් කැඳවන ලද්දේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා බැව් පවසා ඇත. අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ නිළධාරීන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරන ලද අතර පරීක්ෂණයෙන් ලකුණු 40 ට වැඩියෙන් ලබාගත් නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට යොමු කරන ලද බැව් සමන්මලී රූපසිංහ නිලධාරිණිය පවසා ඇත.

04. ඉල්ලුම්කාරිය වන බී.ජී. ප්‍රියානි මහත්මිය විභාගයට පෙනී සිටි අතර ඇයගේ (ප්‍රියානි මහත්මියගේ ) නම, විභාග, අංකය සහ අනිකුත් විස්තර ඇතුළත් කොටස R 6 (a) වශයෙන් බේරුම්කරණ නඩුවට ගොනු කරන ලදී. මෙම විභාගයේදී ඉල්ලුම්කාරිය ලබාගෙන තිබූ ලකුණු ප්‍රමාණය අනුව ඇයද සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇත. එසේ වුවත් ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී නැත. ඒ නිසාම ඇයගේ නම උසස්වීමක් සඳහා නිර්දේශ කර නොතිබුණි.

05. රූපසිංහ මහත්මියගේ මූලික සාක්ෂියෙන් පසුව ඉල්ලුම්කාරිය වෙනුවෙන් සමන්මලී රූපසිංහ සාක්ෂිකාරියගෙන් විමසන ලද වැදගත් හරස් ප්‍රශ්න කීපයක් පහත සඳහන් වේ.

(2015.07.29) වන දින පිටු අංක 128 සිට 131 හි දක්වා ඇත.)

ප්‍ර : පසුගිය අවස්ථාවේදී අපි හරස් ප්‍රශ්න ඇහුවා ජේ. එච්. එස්. දිසානායක මහතාට තනතුරක් ප්‍රදනය කිරීම සම්බන්ධව ?

පි : ඔව්

ප්‍ර : ඒ 4 ලේඛනය යටතේ පුරප්පාඩුවක් තියෙනවා නම් අයදුම්පත් කැඳවන්න ඕනේ නේද?

පි : අයදුම්පත් කැඳවනවා

ප්‍ර : සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා නේද?

පි : ඔව්

(දැනට ආර් 7 ලෙස සලකුණු කර ඇති ලේඛනය ඒ 3 ලෙස ලකුණු කර එම ලේඛනය සාක්ෂිකාරියට පෙන්වා සිටී.)

ප්‍ර : ආර් 7 ලේඛනයේ තියෙන්නේ වැඩ බලන තනතුර සඳහා සුදුසුකම් ලබා ඇති අය කියලා නම් දලා තියෙන ලේඛනයක් නේද?

පි : අනුමත කර ඇති ලේඛනයේ නම් 03 ක් දක්වලා තියෙනවා.

ප්‍ර : නම් 03 ක් දක්වලා තියෙනවාද?

පි : මෙහි සඳහන් දැනටමත් කළුතර, අනුරාධපුර හා මාතර කාර්යාලවල වැඩ බැලීම සඳහා නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඇති අතර එම නිලධාරීන්ගේ නම් ඩී. එම්. කේ. ජී. ඒ. දසනායක, එච්. එම්. අනුර කුමාර සහ ජේ. එච්. එස්. දිසානායක යන අය. (පිටු අංක 131)

ප්‍ර : එම කියන කොටසේ ඒ 4 ලේඛනයේ අංක 02 යටතේ තියෙන විදිහ නෙමෙයි නේද නිර්දේශ කරලා තියෙන්නේ?

පි : අමාත්‍යාංශ ලේකම්ගෙන් විමසලා තමයි ඔය කියන ආර් 7 ලේඛනයේ සේවකයන් පිළිබඳව ගත් ලේඛනයක්.

ප්‍ර : ඔය පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා කටයුතු කරනවා කියලද කියන්නේ?

පි : ඔව්

06. 384 පිටුවේ එනම් ඉල්ලුම්කාරියගේ එම ලිඛිත දේශනයෙන් ලබා ගන්නා ලද කොටසක් පහත දැක්වේ.

ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවයට බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් වූයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියයි. බඳවා ගැනීමේ පරිපාටියේ ඊට අදාළ සහතික කළ පිටපතක් 107 පිටුවේ අමුණා ඇත. (B 3)

ආයතනයේ උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය 03ක් ඇත.

1) ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ පවත්වා උසස්වීම් ලබාදීම.

2) සම්මුඛ පරීක්ෂණ පමණක් පවත්වා උසස්වීම් ලබාදීම.

3) වැඩ බලන තනතුරු ලබා දී පසුව ස්ථිර කිරීම.

ඉහත (1) මඟින් උසස්වීම් ලබාදීම - සමන්මලී රූපසිංහ ගේ 2014.12.23 (පිටුව 5) වන දින පිළිතුරු මඟින් ආයතනය පිළිගෙන ඇත.

ඉහත (2) මඟින් උසස්වීම් ලබාදීම - 2015.02.09 පිටු අංක 4, 5 මඟින් පිළිගෙන ඇත.

ඉහත (3) මඟින් වැඩ බලන තනතුරු සඳහා උසස්වීම් ලබා දී ඇත.

A 01 ලේඛනය මඟින් ආයතනය ඉහත කරුණු පිළිගෙන ඇත. 2015.06.29 වන දින පිටු අංක 10 හි 2 වන ප්‍රශ්නය හා පිළිතුරේදී වැඩ බලන තනතුරු හරහා උසස්වීම් ලබාදී ස්ථිර කරන බව පිළිගෙන ඇත.

ඉල්ලුම්කාරියගේ අධ්‍යාපන සුදුසුකම් රුහුණු විශ්ව විද්‍යාලය මඟින් ලබාගත් සාමාන්‍ය විද්‍යාවේදී (දෙවන පංතිය පහළ පෙළ ගෞරව) උපාධියකි. එම උපාධියට අදාල විෂයන් වනුයේ උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව හා රසායන විද්‍යාව වේ. ( A7. A8 ලෙස සලකුණු කර ඇත) ඉල්ලුම්කාරියගේ 2017.05.24 දිනැති ලිඛිත දේශනයේ 384 පිටුව බලනු මැනවි.

07. ඉල්ලුම්කාරිය ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිමින් එහිදී ලබාගත් ලකුණු A 13 ලේඛනයේ විභාග අංක 1040 හා සේවා අංක 858 යටතේ ප්‍රශ්න පත්‍ර 1 හා 2 සඳහා ලබාගත් ලකුණු පිළිවෙලින් 58. 65 ලෙස සඳහන්ව ඇත. (ඉල්ලුම්කාරියගේ) පියාගේ අවුරුදු 02 හි දානමය පිංකම 2006.08.16 දිනට යෙදී තිබුණු නිසා (ඒ 14) ඊට දින කිහිපයකට පෙර ඇය නිවාඩු ලබා සිටි අතර 2006.08.16 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට ඇයට සහභාගී වීමට නොහැකි විය.

ඊට හේතු වූයේ ආයතනය විසින් 2006.08.14 දිනැති ලිපිය (ඒ 2 ලේඛනය) ඇය සේවය කරන අංශයට යවා ඇතත් ඒ වන විට ඇ නිවාඩු ලබාගෙන තිබීමයි. නමුත් ආයතනය පවසා ඇත්තේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන දිනට සති දෙකකට පෙර ලිපිය යවන බවයි. (2015.03.11 පිටු අංක 5:1 පිළිතුර) නමුත් ඉහත ලිපිය යවා ඇත්තේ සති දෙකකට කලින් නොව දින දෙකකට කලින් බව ඒ 2 ලේඛනය අනුව පැහැදිලි වේ. (ඒ 2 ලිපියේ දිනය 2006.08.14 බව පැහැදිලිව පෙනී යයි.)

08. ''ඉහත සම්මුඛ පරීක්ෂණයට මා හට සහභාගී වීමට නොහැකි වීම සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිතුමාට අභියාචනයක් ඉදිරිපත් කළ නමුත් එයට කිසිදු පිළිතුරක් නොලැබුණි. (2016.05.25 පිටු අංක 9 ඉහළ සිට 4 වන පිළිතුර)

ලිඛිත පරීක්ෂණයට ඉදිරිපත් වූ සේවක අංක 177 එච්. එම්. අනුර කුමාර, සේවක අංක 677 ජේ. එච්. එස්. දිසානායක, සේවක අංක 785 ඩී. එම්. කේ. ජී. ඒ දසනායක යන තිදෙනා සම්මුඛ පරීක්ෂණයට පෙනී නොසිට නිලධාරී III ශ්‍රේණිය ප්‍රදානය කරන ලදී. (එකම ආයතනයක දෙයාකාරයකට ක්‍රියා කිරීම යුක්ති සහගත සහ සාධාරණ නොවේ)''

දෙවන පාර්ශවය වෙනුවෙන් සාක්ෂි දුන් සමන්මලී රූපසිංහ මහත්මිය වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉහත සඳහන් නිලධාරීන් තුන්දෙනාට සහනයක් ලැබී ඇති බවට සාක්ෂි දී ඇත. එහෙත් ඉල්ලුම්කාරියට යුක්තිය ඉටු වී නැහැ.

09.පැමිණිලිකාරිය සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිතුමාත් ඇතුළු ඉහත නිලධාරීන් විසින් ඇයට කරන ලද බලවත් අසාධාරණය සම්බන්ධයෙන් දක්වන ලද කරුණු ඇය විසින් ඉදිරිපත් කරන ලදී. ලිඛිත දේශනවල ඇතුළත් කර ඇති පහත සඳහන් කරුණු මගේ අවධානයට ලක් වී ඇත.

(I) පළමු පාර්ශවය 2006 වර්ෂයේදී නිලධාරී III වන ශ්‍රේණිය ලබාදීම සඳහා 2006 ජූනි මස පවත්වන ලද ලිඛිත පරීක්ෂණයට පෙනී සිට R 6 (a) හි දැක්වෙන පරිදි පිළිවෙලින් පළමුවන ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 58ක්ද දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 65 ක්ද ලබා තිබුණු බව දෙවන පාර්ශවය පිළිගෙන ඇත. ලිඛිත දේශනයේ සඳහන් වන පරිදි 2006.08.16 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයට ඇය R 7 සහ R 7 (a) හි දැක්වෙන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට නොහැකි වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඇයගේ මිය ගිය පියාණන්ගේ දානමය පිංකම්වලට පවුලේ අනිකුත් සාමාජිකයන් සමඟ සහභාගී වූ බැවිනි. මේ හෙළ බොදු පිළිවෙත ලංකාවේ විශේෂයෙන් රුහුණු පෙදෙසේ නොවරදවාම සිදුවන බොදු චාරිත්‍රයකි. මේ කටයුත්ත සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ඉහළ පෙළේ නිලධාරීන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි.

(II) ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට වෙනත් දිනයක් ලබාදීම සාධාරණ බව මමද පිළිගනිමි. එහෙත් සේවා නියුක්තියන්ගේ අරමුදල් මණ්ඩලය ඉල්ලුම්කාරියට මෙසේ සලකා ඇත්තේ මන්දැයි මට තේරුම් ගැනීම අපහසුය.

10. දෙවන පාර්ශවයේ උගත් නීතිඥ සුසන්ත ගුණසේකර මහතාගේ සැල කිරීම් සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශවයේ වෘත්තිය සමිති නියෝජිත විසින් මා වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කිරීමෙන් පසුව එම කොමිෂන් සභාව විසින් දෙපාර්ශවය කැඳවා පැමිණිල්ල විභාග වන අතරවාරයේදීම එම නඩු නිමිත්ත පදනම් කරගෙන R 4 ලේඛනය මඟින් කම්කරු කොමසාරිස්වරයාට පැමිණිලි කිරීම නීති පිළිවෙතට පටහැනිය යන්න පිළිගත නොහැකිය. ඊට හේතුව මානව හිමිකම් කොමිෂන් සභාව බොහෝ විට දෙනු ලබන්නේ තීරණයක් නොව නිර්දේශ කිරීමක් නිසාය. එහෙත් කාර්මික ආරවුල් පනතේ ආරම්භයේ සඳහන් වන්නේ "An Act to provide for the Prevention, investigation and settlement of Industrial dispute and out for matters connected therewith" යනුවෙනි.

11. කෙසේ වෙතත් වග උත්තරකාර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2017.02.16 දිනෙන් ගරු මුදල් අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති පහත සඳහන් ලේඛනයේ (0338) "C" දරණ එකී ලේඛනයේ 3 වන ඡේදයේ මෙසේ සඳහන් වේ. Approval of the cabinet of Ministers is sought for the following proposal.

To proceed with the recommendation submitted by the cabinet Memorandum are annexure I - V in order to grant relief to the persons who have undergone difficulties due to political reasons.

D 0339 හි දැක්වෙන "D" ලේඛනයේ මෙසේ සඳහන් වේ.

"We are pleased to inform you that the Board of direcrors has been granted approval to implement the above decision and accordingly you have been promoted to the post of Enforcement officer (JM 1 - 1 Grade II with effect from 01.01.2015)"

කරුණු එසේ වුවද, බේරුම්කරණයේ දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කාරියට පහත සඳහන් පරිදි තනතුර ප්‍රදානයෙන් මෙන්ම මූල්‍යමය හානියක් සිදු වී ඇති බැව් මාගේ පිළිගැනීමයි.

(I) ඉල්ලුම්කාරිය සේවා නියුක්තකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ IV වන ශ්‍රේණියේ සහකාර නිලධාරිනියක් ලෙස ස්ථිර පත්වීමක් ලැබී ඇත්තේ 1998.10.01 වන දින බවත් ඒ අනුව ඇයට 2001. 10.01 දිනට III ශ්‍රේණියේ නිලධාරි තනතුරට නීත්‍යානුකූලව පත් කළ යුතුව ඇති බවට තීරණය කරමි.

(II) ඇය නිලධාරි III ශ්‍රේණිය ලබා ගැනීමට අධ්‍යාපන සුදුසුකම් සහ සේවා සුදුසුකම් ලබා ඇත.

(III) ඉල්ලුම්කාරිය ලිඛිත පරීක්ෂණයකට සහභාගි වී අවශ්‍ය ලකුණු ප්‍රමාණය ද ලබා ගෙන ඇත. පසු දිනෙක එනම් 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇයට JM-1-1 දෙවන (Grade 11) ඉහළ ශ්‍රේණිය ලැබී ඇත.

(IV) ඇයට සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීමට නොහැකි වූයේ ඇගේ පියාගේ මරණින් පසු පවුලේ පිංකමකට අනිකුත් නැදෑයින් සමඟ එක්වීමට සිදු වූ බැවිනි. එහෙත් මේ නිලධාරිනිය සම්මුඛ පරීක්ෂණයට යාමට නොහැකි වූ බැවින් නිලධාරි iii ශ්‍රේණියට යාම සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර ඇත.

(V) සම්මුඛ පරීක්ෂණයට සහභාගි නොවී ආයතනයේ සේවක අංක 177 එච්. එම්. අනුර කුමාර, සේවක අංක 677 ජේ. එච්. එස්. දිසානායක සහ සේවක අංක 785 ඩී. ඇම්. කේ. ජී. ඒ. දසනායක උසස්වීම් ලබා ඇත.

ඉහත සඳහන් සියලු කරුණු එක් කොට ගත් කල ඉල්ලුම්කාරියට සිදු වී ඇති මූල්‍යමය හානිය නියමිත වෙලාවට ලැබිය යුතු තනතුරු ලැබීම ප්‍රමාද කිරීම නිසා ඇයට සිදු වී ඇති මුල්‍යමය හානිය ගණන් බැලීමක් ගැන යොමුවේ සඳහන් නොවන නමුත්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙන් බී. ජී. ප්‍රියානි යන අයට සිදු වූ මූල්‍යමය හානිය ඉල්ලුම්කාරිය විසින් බේරුම්කරණ නඩුව අවසානයේදී ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම් වන පෙන්වා දී ඇත. එම මුල්‍යමය හානිය සහ ඇයට ගෙවිය යුතු මුදල් සවිස්තර ලෙස 434/A, 434/B පිටුවල පෙන්වා දී ඇත.

ඇයට ගෙවිය යුතු මුදල් ගැන අවබෝධයක් සහ ගණන් බැලීමක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ඉහළ පෙලේ නිලධාරීන්ට ඇතත් , එවැන්නක් දෙවන පාර්ශවයේ ලිඛිත දේශනයේ සඳහන් නොවුවද මුදල් ගෙවීමේදී අනුගමනය කරන චක්‍රලේඛ විගණන අදහස් සම්බන්ධයෙන් ඉල්ලුම්කාරියට වඩා ඉහළ දැනුමක් සහ පලපුරුද්දක් ඇති මණ්ඩලයේ නිලධාරීන් ලවා ඉල්ලුම්කාරියට ගෙවිය යුතු මුදල නිවැරදි ලෙස ගණන් බලා එම මුදල් මෙම ප්‍රදනය සමඟ ආයතනය විසින් ප්‍රදානය කර ඇති 2015.01.01 දිනැති තනතුර 2001.10.01 දිනෙන් පෙර දාතමින් ලබා දීමට මෙම ප්‍රදනය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පල කොට දෙමසක් (මාස 02ක්) ඇතුළත බී.ජී. ප්‍රියානි මහත්මියට ගෙවා අවසන් කරන ලෙස හා තනතුරු ප්‍රදනය කරන ලෙසට සේවා නියුක්තින්ගේ භාර අරමුදල් මණ්ඩලයට නියෝග කරමි. මෙම ප්‍රදනය යුක්ති සහගත සහ සාධාරණ බව මගේ නිගමනයයි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2017 ජූලි මස 27 දින,
නාරාහේන්පිට, කම්කරු මහලේකම් කාර්යාලයේ 09 වෙනි මහලේ කාර්මික අධිකරණයේදී.

12 - 380

මගේ අංකය: IR/COM/03/Q/2014/103.

## කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.02.03 දිනැති හා අංක 1952/36 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.01.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කැලණිය, පට්ටිය හන්දිය, දුටුගැමුණු මාවත, අංක 345/6 හි පදිංචි එන්. ඩී. සී. ආරියවංශ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කැළණිය, කැළණිය විශ්ව විද්‍යාලය, ආයතන අනධ්‍යයන අංශය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.05.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/03/Q/2014/103.

## කාර්මික අධිකරණයේ දීය

එන්. ඩී. සී. ආරියවංශ මිය.
අංක. 345/6,
දුටුගැමුණු මාවත, පට්ටිය හන්දිය,
කැලණිය.

*ඉල්ලුම්කරු*

*නඩු අංක : ඒ - 3628*

*සහ*

ආයතන අනධ්‍යයන අංශය.
කැළණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

*වගඋත්තරකරු*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, උක්ත දෙපාර්ශවය අතර කාර්මික ආරවුලක් පවත්නා හෙයින් එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වර්ෂ 2016.01.28 වන දින මා පත්කොට ඇත.

දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණ වනුයේ කැළණිය විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේ ලිපිකාරිණියක (1 ශ්‍රේණිය) ලෙස සේවය කරන එන්. ඩී. සී. ආරියවංශ මහත්මිය රාජකාරි වේලාව තුල පෞද්ගලික කටයුතු සඳහා ආයතනයෙන් බැහැරයාම පාදක කොට ගෙන මූලික විමර්ශනයක් පමණක් පවත්වා 2013.08.18 වන දිනට හිමි වැටුප් වර්ධකය විලම්භනය කිරීම යුක්ති සහගතද යන්න හා එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

දෙපාර්ශවය විසින් ඔවුන්ගේ මූලික හා ද්විතියික ප්‍රකාශ බේරුම්කරණයට ඉදිරිපත් කිරීමෙන් හා පසු හා එකිනෙකා අතර එකී ප්‍රකාශ

හුවමාරු කර ගත් පසු ඉල්ලුම්කාරිය වෙනුවෙන් මංජුල කොඩිකාර මහතා ප්‍රථම දිනයේ පමණක් ද ඉන්පසු සෑම නඩු වාරයකදීම නීතීඥ චන්දන නිශ්ශංක මහතා පෙනී සිටිමින්ද ආයතනය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (නීති හා ප්‍රලේඛන) නීතීඥ කුමාරි ද සිල්වා මහත්මිය සමග නීතීඥ දමිත්‍රා විතාරණ මෙනෙවිය පෙනී සිටින ලදී.

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛනද ලිඛිත දේශනද විශ්ලේෂණය කිරීමෙන් පසු පහත සඳහන් කරුණු අනාවරණය විය.

1. ඉල්ලුම්කාරිය 1992 අගෝස්තු මාසයේ සේවයට බැඳී ඇති බවත් පළමුව කැළණිය විශ්වවිද්‍යාලයේ උතුරු කොළඹ වෛද්‍ය පීඨයේ සේවය කර පසුව කැළණිය විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේ සේවය කරනු ලබන බව.
2. 2011.12.09 දින උදේ 9.15ට පමණ ලැබුණු දුරකථන ඇමතුමකට අනුව දරුවා යන පාසැල උදේ 10.00ට වසන බැවින් දරුවා රැගෙන යන ලෙස දුරකථන පණිවිඩයක් ලැබුණු බව.

3. සේවයේ යෙදී සිටියදී බැහැර ලේඛනයක් ඇතත් එය විධිමත්ව පවත්වාගෙන යාමක් පෙනෙන්නට නැත. එකී පොතේ සටහනක් තබා රාජකාරී ස්ථානයෙන් පිටතට ගොස් නැවත සේවා ස්ථානයට පැමිණි වේලාව එකී ලේඛනය අනුව තහවුරු

නොවූවත් ලේඛකාධිකාරි දහවල් 1.30ට කැඳවන විට රාජකාරි ස්ථානයේ සිටි බව තහවුරු වේ.

4. මෙදිනට පෙර ද එම පොතේම අත්සන් කර පිටතට ගොස් ඇත. සමහර දිනවල අංශ ප්‍රධානී අත්සන් කර ඇත. සමහර දිනවල අත්සන් කර නැත. වෙනත් අයවලුන්ද ඒ ආකාරයට එම පොතේ අත්සන් තබා ගොස් ඇති බව නිරීක්ෂණය වේ. එම පිටුවේ ලේඛනයේ යම් කපා කොටා වෙනස් කිරීමක් කර ඇති බවද නිරීක්ෂණය වේ.

5. ඉල්ලුම්කාරියගේ වැටුප් වැඩිවීමේ දිනය වූ 2013.08.18. වන දින වැටුප් විලම්භනය කර ඇති බව.

6. විටින් විට කාර්යාලයෙන් පිටව යාම සමග අත්සන් හා වේලාව සටහන් කළත් බොහෝ අවස්ථාවල නැවත පැමිනි වේලාව සටහන් කර ඉල්ලුම්කාරිය හෝ අංශ ප්‍රධානී අත්සන් තබා නැති බව.

7. සැපයුම් අංශයේ සේවය කළ එච්. එන්. නිමල් යන අය ඉල්ලුම්කාරිය වෙනුවෙන් දෙනු ලැබූ සාක්ෂි අනුව 2011.12.09 වන දින පාසැල් වාර අවසන් වූ බව නිවාඩු දෙන දිනයේ පාසැල කලින් වැසීම නිසා ඒ බව දන්වා පාසැලින් ලැබුණු දුරකථන පණිවිඩයක් ලැබුණු බව පිටවීමේ පොතේ සටහන් කර ළමයා රැගෙන ඒමට පිටව ගිය බවත් නැවත පැමිණ ඇති බවත්, එදින අංශ ප්‍රධානීගේ දරුවාටද අසනීපවීම (ඩෙංගු රෝගය) නිසා ඔහු දුකින් සිටි බවත්, ඔහුද 9.30ට පමණ කාර්යාලයෙන් පිටව ගොස් එදින නොපැමිණි බවත් ඒ අතරතුර දහවල් 1.00 ට පමණ රෙජිස්ට්‍රාර් ඉල්ලුම්කාරිය පැමිණුනාදැයි රෙජිස්ට්‍රාර් ඇසූ බවත් ඇය පැමිණ කෑම කන බවත් නැවත 1.30ට ඉල්ලුම්කාරිය රෙජිස්ට්‍රාර් හමුවට කැඳවන ලද බවත් පිටවීමේ ලේඛනය රෙජිස්ට්‍රාර් ගෙන්වාගත් බවත් එය ආපසු නොලැබුණු බවත්ය.

8. ඉල්ලුම්කාරිය වෙනුවෙන් සාක්ෂි දුන් එච්. එන්. නිමල් ප්‍රනාන්දුගෙන් නැවත ප්‍රශ්න ඇසීමේදී ඔහු විසින් පෙන්වා දී ඇත්තේ බැහැරව යෑමේ ලේඛනය විධිමත්ව පවත්වාගෙන නොයන ලේඛනයක් බවයි.

ප්‍ර : "ඔබ දකිනවාද සෑම බැහැරයාමක් ඉදිරියේ ඔබගේ අංශ ප්‍රධානියා අත්සන් කර තිබෙනවාද කියලා"

උ : "මෙය විධිමත්ව පවත්වාගෙන ගිහින් නැහැ"

එම ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමක් නොමැතිවාක් මෙන්ම එය මෙම නඩුවට අදාල කර ගැනීම සඳහා වෙනස් කළා දැයි සැක ඇති වන ආකාරයට "රාජකාරි ක්‍රියා" යන්න උඩින් ලියා ඇති X1 ලෙස ලකුණු කරන ලද ලේඛනයේ දෙවන පිටුවේ ඉහළම තීරුවේ කාරණය යන වැකිය කපා ඇත. තවත් අවස්ථාවක් නම් 2011.08.06 යන දිනයේ වර්ෂය 2010 යන්න 2011 ලෙස වෙනස්කර ඇති බව පෙනේ. මේවා විමර්ශනය කිරීමේදී සැකයක් ඇති වෙයි.

ඉහත සඳහන් ලෙස ඉල්ලුම්කාරියට වාසි සහගත කරුණු විභාගයේදී ඉදිරිපත් වුවත් සේවායෝජක විශ්වවිද්‍යාලයේ ආයතන සංග්‍රහයේ XXII පරිච්ඡේදය පරික්ෂා කරන විට අවුරුදු 3 1/2ක් විශ්වවිද්‍යාල වල සේවය කළ සහකාර ලේඛකාධිචරිය සාක්ෂි දෙමින් ඉල්ලුම්කාරියගේ පෞද්ගලික ලිපිගොනුවේ 2005.01.17 දින සිට මෙම සිද්ධිය දක්වාම සේවයට පැමිණීමේ වේලාව වැරදි ලෙස සටහන් කිරීම පිළිබඳව අවවාද කරන ලද R5, R6, R7 ලේඛන කෙරෙහි ද මාගේ අවධානය යොමු කරවන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුවේදී වූ එකඟතාවය මත කැලණිය විශ්වවිද්‍යාලයේ ආයතන සංග්‍රහය අනුව මූලික විමර්ශනයක් කර ඇත. ඒ අනුව ආයතන සංග්‍රහයේ 22.4.1.1 යටතේ සුළු දඬුවම් යටතේ වරදකට දඬුවම් ලබාදිය හැකිව ඇත. නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම ඇති අපහසුතා හා ප්‍රමාදවීම් පිළිබඳ දිගින් දිගට සිදුවන්නේ නම් වාචික අවවාද දීමෙන් පසු ඒ පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා පැමිණිලිකාරිය පුරුද්දක් ලෙස දිගින් දිගට එම වරදම කරගෙන යාමේදී ලිඛිතව අවවාදකිරීම සාධාරණ වෙයි. එම අවවාද කිරීම් පිළිබඳ R5, R6, R7 සාක්ෂි දීමේදී ලකුණු කර ඇත.

දිගින් දිගටම දරුවන්ගේ කටයුතු පිළිබඳව නිරතවීමට සිදුවීම නිසා ඇයගේ ප්‍රමාදයන්, පැහැර හැරීම සිදු වන බැවින් ඇයට පාලන අධිකාරිය අවවාද කළත් එම අවවාද පිළිනොගෙන ඉල්ලුම්කාරිය කටයුතු කරන තැනැත්තියක බව ඕනෑම අයකුට තහවුරු වෙයි. දරුවන්ගේ කටයුතු සඳහා වෙනත් අයකු යොදා ගැනීම නැතිනම් තම වාර්ෂික නිවාඩු මගින් තම පුද්ගලික කටයුතු ඉටුකර ගත යුතුව ඇත. එසේ නොකර දිගින් දිගට අත්සන් කර හෝ නොකර කෙටි නිවාඩු ලබා ගැනීම සාධාරණ නොවේ.

මූලික විමර්ශනයක් පමණක් පවත්වා 2013.08.18 වැනි දිනට හිමි වැටුප් වර්ධකය විලම්භනය කළේ ඇයිද යන්න හා එය යුක්තිසහගත දැයි සොයා බලන ලෙස දන්වා ඇති බැවින් විභාගය පවත්වන අවස්ථාවේදී පසුගිය සේවා කාලය තුළ දිගින් දිගට සිදුකළ ක්‍රියා හා චර්යා රටා හෙළිදරව් වී ඇති විට ඉහළ පරිපාලනය ගෙන ඇත්තේ ලිහිල් ක්‍රියාමාර්ගයක් බවත් ඒ සඳහා එකී ආයතන සංග්‍රහයේ 7.1 උපයෝගී කරගෙන ඇත. ඒ අවස්ථා වලදී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත. ආයතන සංග්‍රහයේ 7.3 අනුව ආයතන සංග්‍රහයේ 4.1.1 එම උපඡේදයේ සුළු දඬුවම් යටතේ කර ඇති දඬුවමක් වෙයි. අවිධිමත්ව පවත්වාගෙන ගිය බැහැර යාමේ ලේඛනය ගැනත් එම අංශයේ අංශ ප්‍රධානියා 2012.04.05 දින මූලික විමර්ශනයේදී විමර්ශන නිලධාරිට දෙන ලද ලිපියේ "එන්.ඩී.සී. ආරියවංශ මහත්මිය තම රාජකාරි කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකරන බව කිවහැකි යයි" කියා තිබීමත් සලකා වැටුප් විලම්භනය නොකර ආයතන සංග්‍රහය 4.1.1 යටතේ වූ සුළු දඬුවම් යටතේ වන වෙනත් දඬුවමක් නියම කිරීමට තීන්දු කරමි. ඒ අනුව සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමට නියම කරමි.

ඉහත සඳහන් කරන ලද කරුණු ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන ගැන ඉතා විශ්ලේෂණාත්මකව පරීක්ෂා කිරීමෙන් පසු මෙම තීරණයට එළැඹුණි.

මේ ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත බව මාගේ නිගමනයයි.

ආර්. එස්. ආරියප්පෙරුම
බේරුම්කරු
කාර්මික අධිකරණය

2017.05.16

12 - 381

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.